කුරුණෑගල ප්‍රාදේශීය සභාව - 2024
--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය පුකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.157,372 ක් වූ ආදාහනාගාර ගෑස් තොගයේ වටිනාකම ගිණුම්ගත කර නොමැති අතර වටිනාකම රු.32,040 ක් වූ තොග අයිතම් 11 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි කරන බව.	නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයට අදාළව ලැබුණ ප්‍රාග්ධන ආධාර රු.11,464,805 ක් ප්‍රාග්ධන ආධාර යටතේ ගිණුම්ගත නොකර ණයගැති ගිණුමට බැර කර තිබුණි.	2025 වර්ෂයේ ජර්නල් සටහන් මඟින් මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාර්ෂික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවිය යුතු මුදලක් නොතිබියදී වාර්ෂික අයවැය මඟින් වෙන්කළ මුදලේ ඉතිරිය වූ රු.3,638,135 ක් සහ උපකාර්යාල පුස්තකාල ජාලගත කිරීම සඳහා වාර්ෂික අයවැය මඟින් වෙන්කළ මුදලේ ඉතිරිය රු.3,800,000 ක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ නිවැරදි කිරීම සිදු කරන බව.	කිසිඳු බැඳීමක් නොමැතිව ණයහිමි ලෙස ගිණුම්ගත නොකළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ ශ්‍රවනාගාරයට පුටු ලබාගැනීම සඳහා කිසිඳු බැඳීමක් නොතිබුණද රු.2,500,000 ක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි.	සමාලෝචිත වර්ෂයේ 2024 දෙසැම්බර් 31 ශ්‍රවණාගාර පුටු සඳහා 2,500,000 වෙන් කර ඇති අතර එය මිල දී ගැනීමට 2025 වර්ෂයේ කටයුතු කරන බව.	කිසිඳු බැඳීමක් නොමැතිව ණයහිමි ලෙස ගිණුම්ගත නොකළ යුතුය.
(ඉ)	2024 වර්ෂයේදී කසල ට්‍රැක්ටර් රථයක් මිලදීගැනීම සඳහා වාර්ෂික අයවැය මඟින් වෙන්කළ රු.5,000,000 ක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ මෙහෙයුම්	2025 වර්ෂයේ කසල ට්‍රැක්ටරය මිලදී ගැනීම සඳහා මූලික කටයුතු සිදුකරමින් පවතින බව.	කිසිඳු බැඳීමක් නොමැතිව ණයහිමි ලෙස ගිණුම්ගත නොකළ යුතුය.

	වියදම හා ණයහිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.		
(ඊ)	සමාලෝචිත වර්ෂයට අදාළව ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.11,755 ක් වැඩියෙන්ද ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.148,023 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි.	2025 වසරේ මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කරන බව.	නිවැරදි වටිනාකම් ගිණුම්වලට ඇතුළත් කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය රු.619,225 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඌ)	සභාව සතු කැබ් රථයකට සිදුවූ අනතුර සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරියාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන අයකර ගැනීමට තිබුණු රු.741,500 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.2 නොසැසඳුණු පාලන ගිණුම හා වාර්තා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉඩම් හා ගොඩනැගිලි ගිණුමේ ආරම්භක ශේෂය හා උපලේඛනයේ ආරම්භක ශේෂය අතර රු.100,000 ක වෙනසක් පැවතුණි.	2025 මූල්‍ය ප්‍රකාශන උපලේඛණයේ නිවැරදි කරන බව.	උපලේඛන අනුව ගිණුම් ශේෂ සහ මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් ශේෂය ගලපා නිවැරදි කළ යුතුය.
(ආ)	දේපල පිරියත හා උපකරණ ගිණුමේ ශේෂය සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.51,648,187 ක වෙනසක් පැවතුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	වත්කමේ වටිනාකමට සමාන ප්‍රමාණයකින් ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුමට බැර කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයන් 03 ක මූල්‍ය ප්‍රකාශන අනුව එකතු වටිනාකම හා උපලේඛනයේ දක්වා ඇති ශේෂයන් අතර රු.1,905,255 ක වෙනසක් පැවතුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	උපලේඛන අනුව ගිණුම් හා මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් ශේෂ ගලපා නිවැරදි කළ යුතුය.
(ඈ)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පුස්තකාල පොත් වටිනාකම හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ පොත් වටිනාකම අතර රු.5,370,236 ක වෙනසක් පැවතුණි.	2025 වර්ෂය සඳහා මිලදී ගත් පොත් වල වටිනාකම භාණ්ඩ සමීක්ෂණයට ඇතුළත් නොවීම වෙනසට හේතු වී ඇති බව.	සියලුම අයිතම ආවරණය වන පරිදි සමීක්ෂණ කටයුතු සිදු කර වෙනස්කම් හඳුනා ගැනීමට ක්‍රියා කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය	විගණන නිරීක්ෂණය
(අ)	උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයේ දැක්වෙන රු.489,558,020 ක් වූ පෙර වර්ෂයට අදාළ ගැලපීම් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.	මෙම ශේෂ ගිණුම්කරණ අඩුපාඩු හේතුවෙන් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක් පැවත එන බවත් ශේෂ තහවුරු කර ගැනීමට උප ලේඛන සභාව සතුව නොමැති බව.	ගිණුම් ශේෂ තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.
(ආ)	පෙර වර්ෂවලට අදාළ රු.1,012,471 ක විවිධ අත්තිකාරම් ශේෂය සනාථ කිරීමට තොරතුරු ඉදිරිපත් නොකෙරුණි.	විවිධ තැන්පතු හා අත්තිකාරම් ලෙජර ගිණුම්වල පවතින ශේෂ තහවුරු කර ගැනීමට උප ලේඛණ සභාව සතුව නොමැති බව.	ගිණුම් ශේෂ තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම.

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
	මු. රෙ. 371(2)	වටිනාකම රු.1,012,471 ක් වූ කල් ඉකුත් වූ අත්තිකාරම් දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.	නිරවුල් කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ආ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
(i)	2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 චක්‍රලේඛය	සභාව පරිහරණය කරන වාහන 28 ක ආයතනයේ නම සමඟ රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සියලු වාහන සඳහා රාජ්‍ය ලාංඡනය යෙදීමට ඉදිරියේදී කටයුතු කරන බව.	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

(ii)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සභාවේ තාක්ෂණ නිලධාරියෙක්, සංවර්ධන නිලධාරීන් 03 ක් හා දෛනික කම්කරුවන් 06 දෙනෙක් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.	දෝෂ නිවැරදි කර ඇඟිලි සළකුණු ලබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර මනා මානව සම්පත් කළමනාකාරණයක් පවත්වා ගත යුතුය.
(ඇ)	1992 පෙබරවාරි 26 දිනැති අංක 05/01/ 119 දරන නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය	සැලසුම් කමිටුව කාර්යාල වේලාවෙන් බැහැරව පැවැත්විය යුතු වුවත් සභාව විසින් සවස 01 ත් 02 ත් අතර කාර්යාලීය වේලාව තුල ආරම්භ කර ඒ සඳහා දීමනා ලෙස රු.553,500 ක් ලබාගෙන තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	උපදෙස් ලිපිය අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.137,410,669 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.244,928,314 ක් විය.

2.2 මූල්‍ය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු බැංකු ඉතිරි කිරීමේ ගිණුමේ සමාලෝචිත වර්ෂය පුරාවට රුපියල් මිලියන 260 කට වැඩි සාමාන්‍ය ශේෂයක් රඳවා තබා ගැනීම හා ඉහල ප්‍රතිලාභ ලැබිය හැකි ආයෝජන මාර්ගවල යෙදවීම කෙරෙහි හෝ මහජන සේවා සපයන ව්‍යාපෘතිවල යෙදවීමට කළමනාකරණයේ අවධානය යොමු නොකිරීම නිසා ඉහළ ප්‍රතිලාභයක් සභාවට අහිමි වී තිබුණි.	2025 වර්ෂයේ ස්ථාවර තැන්පත් ආරම්භ කිරීමට කටයුතු කර ඇති බව	මුදල් නිශ්කාර්යව නොතබා උපරිම ඵලදාවක් ලැබෙන ආයෝජන මාර්ගවල ආයෝජනය කිරීමට හෝ ව්‍යාපෘතිවල යෙදවීමට කටයුතු කළ යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම් ප්‍රභවය	2024 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම	 බිල් කළ ආදායම	 රැස්කළ ආදායම	 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	2023 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම	 බිල් කළ ආදායම	 රැස්කළ ආදායම	 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
වරිපනම් හා බදු	16,304	19,347	20,892	11,247	11,244	29,037	16,245	12,791
කුලී	3,029	3,954	3,476	725	1,253	2,016	1,768	248
බලපත්‍ර ගාස්තු	2,494	2,856	2,856	-	2,201	2,735	2,735	-
වෙනත් ආදායම්	230,801	230,801	187,676	233,305	190,180	190,180	2,835	190,180
එකතුව	252,628	256,958	214,900	245,277	204,878	223,968	23,583	203,219

2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රුපියල් මිලියන 257 ක් වූ අතර පෙර වර්ෂයන්ට අදාළව හිඟ ආදායම් ලැබීම්ද ඇතුළුව රුපියල් මිලියන 215 ක් සමාලෝචිත වර්ෂයේ රැස්කර තිබුණි. ඉකුත් වර්ෂවල හිඟ සමඟ සමාලෝචිත වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 245 ක් තවදුරටත් අයකර ගැනීමට පැවතුණි.	සමාලෝචිත වර්ෂය අවසානයට පවතින හිග මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ මුදල් අප්‍රමාදීව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**වරිපනම් හා බදු**		
(i)	සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.12,791,470 ක වරිපනම් බදු හිඟයෙන් රු.3,582,558 ක මුදලක්ද වර්ෂයේ බිල්කිරීම් රු.19,346,939 ක මුදලින් රු.7,349,283 ක මුදලක් ද අයකර නොතිබුණි.	හිඟ මුදල් අයකර ගැනීම සඳහා ජංගම සේවා වැඩසටහන් ක්‍රියාත්මක කරන බව.	හිඟ වරිපනම් බදු අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	ප්‍රාදේශීය සභාව වෙත 2024 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන 06 කින් එකතුව රු.369,642 ක වරිපනම් හිඟ ගාස්තු අයවීමට පැවතුණි.	එම මුදල් ගෙවන ලෙස හිග ගාස්තුද සඳහන් කරමින් වාර්ෂිකව නිවේදන යවා ඇති බව.	අදාළ ආයතන දැනුවත් කර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂයෙන් රු.4,125,587 ක් වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණි.	ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂයෙන් රු.2,517,032 ක් වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණි.	සොයා බලා මු.රෙ අනුව කටයුතු කරන බව.	ගෙවිය යුතු ශේෂවල පැවැත්ම ගැන සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 27 දින දක්වා සභාව වෙත ලැබී තිබුණු මහජන පැමිණිලි 338 න් පැමිණිලි 63 ක් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.	විධිමත් රාජකාරිමය පැවරීමක් ලෙස සමස්ත ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශයම තාක්ෂණ නිලධාරින් 05 දෙනෙක් සඳහා කලාප 05 ක් යටතේ බෙදා වෙන් කර රාජකාරි පවරා ඇති බැවින්, ඔවුන් වෙත පැවරෙන වෙනත් තාක්ෂණික රාජකාරිවල වැඩ ධාරිතාවයට සාපේක්ෂව මහජන පැමිණිලි සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට ගතවන කාලය වෙනස් වී ඇති බව.	මහජන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට නිලධාරියෙකු පත්කර කඩිනම් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය.

3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභාව සතු තක්සේරු වටිනාකම රු.7,500,000 ක් වූ ගල් රෝලය 2016 වර්ෂයේ සිට සහ වටිනාකම රු.40,000 ක් වූ මෝටර් සයිකලය 2019 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි.	• ගල් රෝලය විශාලත්වයෙන් වැඩි බැවින් මෙම බල ප්‍රදේශයට අයත් මාර්ග පද්ධතියට යොදා ගත නොහැකි බව. • මෝටර් සයිකලය අළුත්වැඩියා කටයුතු සිදු කිරීමෙන් පසු රාජකාරී කටයුතු සඳහා යොදාගනු ලබන බව.	සභාවේ වත්කම් තුළින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට ප්‍රයෝජනයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමට හෝ කටයුතු කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1993 පෙබරවාරි 08 වන දින වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ලැබුණු කැබ් රථය සමාලෝචිත වර්ෂය වන විටද සභාව නමට පවරාගෙන නොතිබුණි.	ඉදිරියේදී අදාළ අනුමැතිය ලබාදුන් පසු සභාව නමට පවරාගැනීමට කටයුතු සිදුකරන බව.	සභාව භාවිතා කරන වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	වැල්ලව රෝහල පිටුපස පිහිටි ඉඩම් කට්ටි 10 කට පිවිසීමට ස්ථිර මාර්ගයක් ලබාගැනීම සඳහා ප්‍රාදේශීය සභාව හා ඉඩම් හිමියන් විසින් එකතුව රු.1,100,000 ක් 2023 මැයි 09 දින කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවීම් කර තිබුණද 2025 මාර්තු 31 දින වන විටත් මාර්ගය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	පවරා ගැනීම් කටයුතු මේ වනවිටද ක්‍රියාකාරි මට්ටමින් පවතින බව.	ප්‍රාදේශීය ලේකම් දැනුවත්කර අත්පත් කරගැනීමේ කාර්යය කඩිනමින් කරවා ගත යුතුය.

3.4 ප්‍රසම්පාදනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රසම්පාදන සැලැස්මේ 2024 වර්ෂයේ ප්‍රගතිය පරීක්ෂාවේදී ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 5.9 ක සුභසාධක වැඩ සටහන් 06 කට අදාළව ප්‍රගතිය සියයට 0 සිට සියයට 09 දක්වා අවම මට්ටමක් පැවතුණි.	ඉදිරියේදී වියදම් විශ්ලේෂණයක් කර වැය ශීර්ෂයට අදාළ මුදල් වෙන් කිරීමට කටයුතු කරන බව.	ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාවට නැංවීමට ක්‍රියා කළ යුතුය.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**සාරගම භූ දශර්න සැකසීමේ ව්‍යාපෘතිය**		
(i)	පළමු අදියර 2024 මැයි 15 දින අවසන් කලයුතු වුවත් 2024 ජූනි 11 දින වැඩ අවසන් කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අංක 04 ට අනුව ව්‍යාපෘතිය සති 04 ක ප්‍රමාද කාලය සඳහා රු.27,837 ක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අයකරගෙන නොතිබුණි.	ප්‍රමාද ගාස්තු අය කිරීම අතපසු වී ඇති බව.	ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කිරීමට ක්‍රියා කළ යුතුය.
(ii)	සූර්ය බල විදුලි ලාම්පු ආවරණය කිරීම වෙනුවෙන් රු.1,012,560 ක වියදමක් දරා සකස් කර තිබුණු යකඩ කම්බි ආවරණ මාස 06 ක් ඉක්ම යාමට ප්‍රථම ස්ථාන 04 ක කැඩී තිබීම හා සූර්ය බල විදුලි ලාම්පු 04 ක් කැඩී තිබීම දක්නට ලැබුණි.	හානි ප්‍රතිපූර්ණ මුදල ලබාගැනීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් කටයුතු කර නැවත බල්බ හා ආවරණ ඉදිකිරීම සිදු කළ හැකි බව	මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කර හානි පූරණය කළ යුතුය.

(ආ)	**මල්කඩුවාව බණ්ඩාරනායකපුර දිවාරාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගණය**		
(i)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 වගන්තිය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් නොකර වෙන්කළ මුදලට සරිලන පරිදි ඇස්තමේන්තු සකස් කර අදියර වශයෙන් ප්‍රජා පාදක සංවිධාන මඟින් ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි.	මුළු පිරිවැය ඇස්තමේන්තුවට අදාළව ගිවිසුම් ගතවීමේ හැකියාවක් හෝ එම අවස්ථාවේ අමතර මුදල් සහා අරමුදලින් වෙන් කර ගැනීමේ හැකියාවක් නොතිබිණි. ඒ අනුව වෙන් කළ ප්‍රතිපාදනවලට අදාළව පමණක් ඇස්තමේන්තු සකස්කර ගිවිසුම් ගත වීමට කටයුතු කර ඇති බව.	මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අනුසාරයෙන් ව්‍යාපෘතියක් ආරම්භ කළ යුතු අතර ලැබෙන ප්‍රතිපාදන අනුව ඇස්තමේන්තු සකස් කළ යුතුය.
(ii)	වොලිබෝල් ක්‍රීඩාපිටිය ඉදිකර තිබූ ස්ථානයට ඉහලින් අධිබලැති විදුලි රැහැන් පද්ධතියක් ඇද තිබීම ක්‍රීඩකයින්ගේ ජීවිත අවධානය සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බවත් නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකිරීම මේ සඳහා හේතු වී ඇති බවත් වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ.	එම ස්ථානයේ ක්‍රීඩාකිරීමට අනාරක්ෂිත බවත් පවතීද යන්න පිළිබඳව තහවුරුවක් ලබාගැනීම සඳහා වයඹ ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා ඒකකය වෙත ලිපියක් යොමුකර ඇති අතර එම වාර්තාව ලැබුණු පසු ඉදිරි කටයුතු සම්බන්ධව තීරණයක් ගැනීමට නියමිත බව.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතුය.
(iii)	2024 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ක්‍රීඩාපිටියේ මූලික ඉදිකිරීම් සඳහා රු.1,469,950 ක් වැයකර අවුරුදු 03 ක් ගතවී තිබුණත් තවදුරටත් සිදුකළ යුතු ඉදිකිරීම් සිදු නොකිරීම නිසා ප්‍රයෝජනයට නොගෙන වල් බිහි වී පවතින බව නිරීක්ෂණය විය.	ක්‍රීඩා අමාත්‍යාංශයේ වාර්තාව ලද වහාම මේ සම්බන්ධව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව.	ශක්‍යතා අධ්‍යනයක් සිදු කර ව්‍යාපාති ආරම්භ කළ යුතුය.
(ඇ)	ශාන්ති විහාර මාවත අතුරු මාර්ගය හා ශාන්ති විහාර මාවත II වන අදියර මාර්ගය කොන්ක්‍රීට් ඇතිරීම වෙනුවෙන් එකතුව රු.6,250,000 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්තුව කිරීමට ගොවි සංවිධානයට පවතින හැකියාව පිළිබඳව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හැකියා සහතිකය නිකුත් කිරීම, ප්‍රාදේශීය සභාව සමඟ ගිවසුම්ගත වීම, මාර්ගය තැලීම, කොන්ක්‍රීට් ඇතිරීම හා කොන්ක්‍රීට් සාම්පල් ලබාගැනීම යන අවස්ථා සියල්ල 2023 දෙසැම්බර් 22 දිනයේ එනම් එකම දිනකදී සිදු කර තිබුණි.	ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගයක් බැවින් හා දෙසැම්බර් 31 දිනට පෙර ගෙවීම් වාර්තා ඉදිරිපත් කළ යුතු බැවින් සිය උපරිම කැපවීම යොදා ගිවිසුම් ගත දිනයේ ම මාර්ග තලය සකස්කර ගැනීම සිදුකරන ලදි. මෙම වැඩ කටයුතු සිදුවන අතරතුර පළාත් පාලන ඉංජිනේරුතුමාද වරින් වර පැමිණ අවශ්‍ය උපදෙස් ලබාදුන් අතර ව්‍යාපෘතිය ඉටුවන කාලය තුල පූර්ණ අධීක්ෂණය ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරින් විසින් සිදු කරන ලද බව.	මෙවැනි තත්ත්වයක් ප්‍රායෝගිකව සිදුවිය නොහැකි බැවින් සැලකිලිමත්ව කටයුතු කළ යුතුය.
(ඇ)	**මල්කඩුවාව බණ්ඩාරනායකපුර** කායවර්ධන **මධ්‍යස්ථාන ගොඩනැගිල්ල අදියර I**		
(i)	ඉදිකිරීමට අදාළ සැලැස්ම (Drawing) ලිපිගොනුව තුළ නොතිබුණු අතර	මුලු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමට නොහැකි වූ අතර, පසුව	මුළු පිරිවැය ඇස්තතමේන්තුවක්

	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 වගන්තිය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි.	ඇස්තමේන්තුවක් සකස්කිරීමට කටයුතු කිරීමට සැලැසුම් කරන ලද බව.	සකස් කර ව්‍යාපෘති ආරම්භ කළ යුතුය.
(ii)	අදියර I යටතේ බිම්මහලේ ඉදිකළ කඩකාමර 03, 2024 දෙසැම්බර් 31 දින වන විට වසර 04 ක කාලයක් බදු දීමට කටයුතු නොකිරීම හා ඉතිරි ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු නොකිරීම.	අදාළ කඩකාමර ඉදිකිරීම අවසන් කර තිබුණද එයට අදාළ තවත් ඉදිකිරීම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට තිබෙන හෙයින් මෙම කඩ කාමර බදු දීමට නොහැකි වී ඇති බව.	මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ව්‍යාපෘති ආරම්භ කළ යුතුය.
(iii)	මෙම ගොඩනැගිල්ලේ උඩුමහල ඉදිකිරීම සඳහා ස්ලැබ් එක මත යොදා තිබුණු කොලොම් කනු 14 ක කම්බි සොරුන් විසින් කපා විනාශ කර තිබීම.	අදාළ භූමිය පිරිසිදු කිරීමට කටයුතු සිදුකරන බවත් ගොඩනැගිල්ල සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදුකරන බව.	සභා දේපළ ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.
(ඉ)	වැල්ලව සාප්පු සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම් සැලසුම් කිරීමේදී භූමියේ පවතින විශේෂ ලක්ෂණ හඳුනාගෙන ඒ සඳහා සුදුසු පිළියම් යෙදිය යුතු වුවත් පළමු, දෙවන හා තෙවන අදියර තුනේදීම මෙහි පවතින ඇළ මාර්ගය සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි. ඒ හේතුවෙන් මෙම ඇළ මාර්ගයේ ජලය මෙම ඉදිකිරීම් සිදු කරන ගොඩනැගිල්ල හරහා ගමන් කරන බැවින් ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර සැලසුම් අනුමත කර ඇති බවටත් බිම් මහලේ ඉතිරි ඉදිකිරීම් සිදු කිරීමට මෙම ඇළ මාර්ගය බාධා විය හැකි බවත් නිරීක්ෂණය විය.	ප්‍රධාන මාර්ගය හරහා පිහිටුවා ඇති බෝක්කුවෙන් ගලා එන ජලය මෙම ඉඩම හරහා පහළ ඇළ ඔස්සේ ගලා යාම සිදුවන්නේ බිම් මහලට වඩා පහළ මට්ටමකින් බව.	විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදු කර ව්‍යාපාති ආරම්භ කළ කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරු 08ක් සඳහා නිලධාරීන් 23 දෙනෙකු සභාව විසින් බඳවාගෙන තිබුණි.	සියලු තනතුරු අනුමත කර ගැනීම සඳහා මේ වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව.	තනතුරු අනුමත කර ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ආ)	බඳවාගත් තනතුරේ රාජකාරි ඉටු නොකරමින් වෙනත් තනතුරක සේවයේ යෙදී සිටින නිලධාරීන් 15ක් විය.	මෙම නිලධාරීන් සියලුම දෙනා සේවා අවශ්‍යතාවය මත රාජකාරිවල යොදවා ඇති බව.	බඳවාගත් තනතුරේ රාජකාරී ඉටු කිරීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සෞඛ්‍ය අංශයේ ඉටුකිරීමට සැලැසුම් කළ ව්‍යාපෘති 20 න් රු.3,260,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු ව්‍යාපෘති 05 ක් ඉටුකර නොතිබුණු අතර භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි අංශයේ ඉටුකිරීමට සැලසුම් කළ ව්‍යාපෘති 12 න් රු.10,339,500 ක ප්‍රතිපාදන සලසා තිබුණු ව්‍යාපෘති 04 ක් ඉටුකර නොතිබුණි.	විවිධ ගැටළු හේතු කරගෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කිරීමට නොහැකි වූ බව.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ රු.49,759,747 ක ව්‍යාපෘති 44 ක් වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන සලසා නොගෙන ඉටුකර තිබුණි.	වර්ෂයේ සකස්කරන ලද ක්‍රියාකාරී සැලැස්මට කිසිදු ආකාරයකින් බිඳ වැටීමකින් තොරව ක්‍රියාත්මක කර වඩාත් ඵලදායි කළමනාකරණ මෙවලමක් ලෙස සභාව යොදාගෙන ඇති බව.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කළ යුතුය.

4.2 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් දැනුවත්ව සභා බල ප්‍රදේශයේ ජනතාවගේ විවිධ වූ අවශ්‍යතා වෙනුවෙන් රු.34,050,970 ක් වැයකර වැඩසටහන් 15 ක් ක්‍රියාත්මක කර තිබුණි.	ප්‍රවර්තන වර්ෂයේද තිරසාර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරන බව.	තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.